

# දරුවාට දඬුවම දඟකමට සමානුපාතික ද ?

දරුවන් දඟකාර නම් මව්පියන් සතුටු විය යුතුය. ඒ ඔවුන් නිරෝගී නිසාය. ඔවුන් සතුව ඇති තරම් ශක්තිය තිබෙන බව ඔබ තේරුම් ගත යුතුය. සමහර දරුවන් අන් දරුවන්ට වඩා දඟය. සමහරු කටකාරය හිතුවක්කාරය. තවත් සමහර දරුවන් ලැජ්ජාශීලිය. මේ අයුරින් වැඩිහිටියන් සේම විවිධ ගතිගුණ ඇති දරුවෝ සමාජයේ සිටිති. දරුවකු විනය ගරුක අයකු ලෙස හදා වඩා ගැනීම මව්පිය ගුරුවරුන් ගේ වගකීමකි.

**වෘත්තිය මනෝවිද්‍යා උපදේශිකා - චාන්දිමා මුනමලේ ඇපා**

බොහෝ මව්පියන් ගුරුවරුන් දරුවා නිසිපරිදි හදා වඩා ගැනීමේ වුවමනාවෙන් දරුවාට දඬුවම් කරන අවස්ථාවලදී බොහෝ විට දරුවාට යහපතකට වඩා අයහපතක් සිදු වෙයි. දඬුවම් දීමේ අරමුණ දරුවා හික්මවා ගැනීම, නැවත එම වරද නොකරන්නට පාඩමක් ඉගැන්වීම, විනය ගරුක බව ඇති කිරීම විය හැකිය.

නමුත් සමහර මව්පියන් ගුරුවරුන් දරුවාට දඬුවම් දෙන්නේ තම කෝපය පිට කර ගන්නට ය. දරුවා කළ වරද කෙරෙහි කෝප වන මව පියා හෝ ගුරුවරයා දරුවාට දඬුවම් පමුණුවයි.

මෙය කායික හෝ මානසික දඬුවමක් විය හැකි ය. ළමයාට ලැබිය හැකි වරප්‍රසාදයක් අහිමි කිරීම, තරවටු කිරීම, ශාරීරිකව දඬුවම් කිරීම වැනි විවිධ ක්‍රම මඟින් මෙන්ම විවිධ වැඩ කොටස් පැවරීමෙන් ද දඬුවම් ලබා දෙන බව අපි දනිමු. එක් දැරියක් තම සොයුරියක සමඟ දබරකර ගැනීම නිසා කෝපයට පත් මව දරුවා ගේ ළමා වයස ගැන නොතකා ඇයට කුකුළු ගොව්පල සුද්ධ පවිත්‍ර කිරීමට භාර දුන්නාය. මවට එදා කිරීමට තිබුණු එම වැඩ කොටස දරුවාගේ වරද පිට පටවා දරුවා ලවා කරවා ගත් බව මෙහිදී පෙනීයයි.

මං වගේ පොඩි ළමයකුට ඒ වගේ වැඩ කොටසක් කරන්න පුළුවන් ද ? මට එදා අම්ම එක්ක ආව කේන්තිය කලකිරීම අදටත් තියනවා. දැන් යොවුන් වියේ සිටින එම දැරිය පැවසුවාය. තවත් දැරියක් පවසා සිටියේ ඇයට තරවටු කරන මව ඇය සමග කතාබහ නොකර සිටින බවයි.

මගේ අතින් පොඩි වැරැද්දක් වුණත් අම්ම දවස් ගාණක් යනකල් කතා කරන්නේ නෑ.

කෑම බෙදලා දෙන්නේ නෑ. මාව ගණන් ගන්නේ නෑ, මට ඉවසන්න බෑ ඒ දඬුවම නම් ඇය පැවසුවාය.

පන්තියේ වාර විභාගයේ දී ලකුණු අඩු වීම නිසා දරුවන්ට තලා පෙලා දඬුවම් කරන මව්පියවරු සිටිති. තරග විභාගයක ලකුණු අඩුවුවහොත් කන්නට, බොන්නට නොදී නිවසින් එළවා දමන බවට තර්ජනය කරන මව්වරු ද වෙති. මවට ඇති බිය නිසාම දරුවා පාඩම් කටයුතු කරන්නේදැඩි කාංසාවකින්(Anxiety)යුතුවයි. පහ වසර ශිෂ්‍යත්වය නිසා ළමා කාලය අහිමි කර ගනිමින් පීඩාවට පත්වන දරුවන් අපමණය. මව්පියන් ගේ සිහින සැබෑ කරන්නට ගොස් මානසිකව බිඳ වැටුණු දරුවෝ සිටිති.

ඇතැම් මව්වරු තම දරුවන් කීප දෙනා අතරින් දක්ෂතා දක්වන්නන්ට වැඩි පුර ඇලුම් කරමින් අන් අය පහත් කොට සලකන්නට යොමු වෙති.එසේ කිරීමෙන් දරුවා හික්මෙන බව මව සිතුව ද, සිදුවන්නේ දරුවා කලකිරීමට පත් වීමත් පෞරුෂයට හානි වීමත් ය. මෝඩයා කිසිකමකට නැති ළමයා, මොනම වැඩක් වත් බැහැ..." ආදී වශයෙන් දරුවාට වාචික දඬුවම් දෙන මවකට පියකුට ගුරුවරයකුට දරුවා වරදින් මුදවා ගැනීමට නම් කිසි විටෙක නොහැකිවනු ඇත. පිටස්තර පුද්ගලයින් ඉදිරියේ මෙසේ ලැජ්ජාවට පත් වන ළමෝ විවිධ අසාමාන්‍ය චර්යාවන්ට යොමු වෙති. හීනමානය, ප්‍රකෝපකාරී වීම, සමාජයට බිය වීම වැනි විවිධ ලක්ෂණ සහිත දරුවන් සමාජයට දායක කරන්නේ මෙවැනි මව්පියන් ය.

දෙනු ලබන දඬුවම දරුවා ගේ වදරට සමානුපාතික විය යුතු ය. පාඩම් වැඩ අතපසු කළ දියණියට එදින රූපවාහිනිය නැරඹීම හෝ මිතුරු කණ්ඩායම් සමඟ සෙල්ලම් කිරීමට යාම වැළැක්වීම වැනි දඬුවමකින් ඇයව පාඩමට උනන්දු කිරීමේ වරදක් නැත. දඬුවම් දෙනවිට දරුවාට නොගැළපෙන වචන වලින් ඇමතීම කිසිසේත් ම නො කළ යුතු ය. දරුවාට දෙන දඬුවම කළ වරදට හා එම වයසට සමානුපාත විය යුතු ය. එය වැඩිහිටියාගේ කෝපයට සමානුපාතික නොවිය යුතුය. තවත් වැදගත් කරුණක් වන්නේ දෙනු ලබන දඬුවමට මවත් පියාත් දෙදෙනාම එකඟ වීමයි. නැතහොත් එමඟින් ද දරුවා අපහසුතාවයට පත් වෙයි. "මෙහෙ එන්න මගෙ දුව" තාත්තා බැන්නා නේද ? එයා හරි නරකයි. දුව මගෙ ළඟට වෙලා ඉන්න. යනාදී ලෙසින් එක් අයෙක් දෙන දඬුවමට මව හෝ පියා විරුද්ධ නම් දරුවා තේරුම් ගන්නේ තමා නිවැරදි බවත් පියා වැරදිකරු බවත් ය. නමුත් මීළඟ අවස්ථාවේ එම වරදටම නැවත ඇය මවගෙන් දඬුවම් විඳීමට ද ඉඩ තිබේ. එවිට දරුවා අවිනිශ්චිත තත්ත්වයට පත්වීම සිදු වේ. නමුත් මේ සියලුම දේට වඩා වැදගත් වන්නේ උපදෙස් දීම මඟින් දරුවා යහමගට ගැනීමයි. දරුවා ළඟට ගෙන වරද වටහා දී නැවත එය කිරීමෙන් සිදුවන හානිය පෙන්වා දී ඔහු හෝ ඇය ඉන් මුදා ගත හැකිනම් එය දඬුවම් කිරීමට වඩා ඉතා යහපත් ක්‍රියාවකි.

මව්පියන් ආදර්ශමත්ව කටයුතු කිරීම ද වැදගත් ය. තමා කාර්යාලයේ දී කී බොරුවක් ගැන මව පියා සමඟ රස කරමින් විස්තර කියන විට අසා සිටින දරුවාට තමා පාසැලේ දී කී බොරුව ගැන අම්මා තමාට දඬුවම් දෙන්නේ කෙසේදැයි ප්‍රශ්නයක් මතුවිය හැකි ය. පාරිභෝගිකයින් සමඟ වංචනික ලෙස ගණුදෙනු කරන ව්‍යාපාරික හිමියකු තම දරුවගෙන් අවංක බව බලාපොරොත්තු වීමේ එලක් නැත. මවත් පියාත් ආදර්ශයෙන්ම දරුවන්ව යහමඟට යොමුකර ගැනීම දඬුවම් දෙමින් ඔවුන් විනයගරුක පුද්ගලයින් කරනවාට වඩා සුදුසු ය. නමුත් අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය පරිදි දරුවාට සුදුසු දඬුවමකින් පාඩමක් ඉගැන්වීම ද වරදක් නොවන්නේ ය.

යොවුන් දියණියක ගේ පෙම් හසුනක් මව අතට පත්වීම ඇයට දැඩි දඬුවම් පැමිණවිය යුතු බරපතල වරදක් නොවෙයි. ඇගේ වයස අනුව ඇයට අවවාද කොට අධ්‍යාපන කටයුතුවලට විය හැකි බාධාව සහ ඇතිවිය හැකි වෙනත් ගැටලු පෙන්වා දී දියණිය තවදුරටත් තමාට ළංකර ගැනීමට මවට හැකි විය යුතුයි. එසේ නැතහොත් ඇයට තලාපෙලා නිවසේ සිරකාරියක් බවට පත් කිරීමෙන් ඇය නොමඟට පෙළඹීමේ ප්‍රවණතාව තවත් වැඩිවනු ඇත. තම ප්‍රේමයට විරුද්ධ වූ මව්පියන් "කොල්ලා එක්කම පලයන්" කියා තමාව නිවසින් එලවූ බවත්, සියදිවි හානි කර ගන්නට ගිය තමාව වළකා ගත් තම මිත්තණිය සමඟ දැන් ජීවත් වන බවත්, නැවත කිසිදාක ගෙදර නොයන බවත් උපදේශනයට පැමිණි එක් දියණියක් කීවාය. ඇගේ මව ගුරුවරියකි.

ප්‍රේමය නිසා නිවසේ සිරකාරියක් බවට පත්ව සිටි ඉංජිනේරු යුවළක ගේ එකම දුව උසස් පෙළ විභාගය අවසන් වූ දවසේ තම පෙම්වතා සමඟ පලා ගියා ය. ඇය උපදේශන ස්ථානයට පැමිණියේ වසර 4 ක් තිස්සේ ඔහු සමඟ ගත කළ කාළකන්නි ජීවිතයෙන් ගැලවීමක් අවශ්‍ය බව පවසමිනි.මව්පියන් ගේ උගත්කම අභිබවා ඉක්මන්කම පැමිණීම නිසා මෙවැනි දරුවන් ද ඔවුන් ගේ මව්පියන් ද මහත් පීඩනයක් විඳියි. දරුවා ගත කරන වයස, එම වයසේ දී ඇතිවිය හැකි ක්‍රියාකාරිත්වය හා ඔවුන් අතින් විය හැකි වැරදි පිළිබඳවත්, ඒවා නිවැරදි කරගැනීමට උපක්‍රමශීලි ලෙස කටයුතු කරන අයුරුත් මව්පියන් සේම ගුරුවරුන් ද දැන සිටීම

යොවුන් දියණියක ගේ පෙම් හසුනක් මව අතට පත්වීම ඇයට දැඩි දඬුවම් පැමිණවිය යුතු බරපතල වරදක් නොවෙයි. ඇගේ වයස අනුව ඇයට අවවාද කොට අධ්‍යාපන කටයුතුවලට විය හැකි බාධාව සහ ඇතිවිය හැකි වෙනත් ගැටලු පෙන්වා දී දියණිය තවදුරටත් තමාට ළංකර ගැනීමට මවට හැකි විය යුතුයි. එසේ නැතහොත් ඇයට තලාපෙලා නිවසේ සිරකාරියක් බවට පත් කිරීමෙන් ඇය නොමඟට පෙළඹීමේ ප්‍රවණතාව තවත් වැඩිවනු ඇත.

රටට වැඩදායි දරුවන් ඇතිවීමට ඉවහල් වන කරුණකි.

සෑම දරුවකුම එක හා සමාන නොවන බව වැඩිහිටියන් අවබෝධ කරගත යුතු මූලික කරුණකි. තැන්පත් ගතිගුණ සහිත අය මෙන්ම දඟකාරකම්වලට පෙළෙඹෙන දරුවන් ද ඉගෙනීමේ දක්ෂ අය මෙන්ම වෙනත් අංශයකින් දක්ෂතා පෙන්වන්නන් ද එකම පවුලක සිටිය හැකියි. ඒ ඒ දරුවා ගේ දක්ෂතා හා හැසිරීම් රටා හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කරනු මිස, යම් ආකෘතියකට අනුව ඔවුන් හැඩගැස්වීමට යාම සමහර විට අහිතකර ප්‍රතිඵල ගෙන දෙනු ලබයි. සොයුරියක සොහොයුරකු ඥාති සොයුරියක හෝ පංතියේ මිතුරකු පෙන්වන දක්ෂතා පෙන්වීමට එසේ හැකියාවක් නැති දරුවා පොළඹවා ගැනීමට උත්සාහ ගැනීම දරුවාට හානිකර විය හැකිය. ඒ වෙනුවට වැඩිහිටියකු විසින් කළ යුත්තේ දරුවාට තමාගේ හැකියාවන් ඔප්නංවා ගැනීමට උදව් කිරීමයි.

අම්මා හැමදාම ගන්නේ අක්කගේ පැත්ත. අක්ක මට වඩා දක්ෂයිලූ. ලස්සනයිලූ කියන දේ අහනවලු මට ඒ මොකුත් නැති බව තමයි අම්මා හැම වෙලාවෙම කියන්නෙ. මම නිසා පවුලත් විනාශ වෙයි කියනවා. මම කිසිම වරදක් කරලා නෑ. ඒත් මම හැමකෙනකුටම හොඳින් කතා බහ කරනවා. කරන්න පුළුවන් උදව්වක් කරනවා. අම්මා ඒවට කැමති නැහැ.

හිඟන්නකුට කන්න දෙයක් දුන්නත් නැති බැරි යාළුවකුට උදව්වක් කළත් දොස් කියනවා. මට බෑ එහෙම උදව් නොකර ඉන්න. මම කොහොම හරි හොඳට ඉගෙනගෙන ඉහළට යනවා. එතකොටවත් අම්මා මට ආදරේ වෙයිනේ. මට හරි දුකයි කිසිම වරදක් නොකර මෙහෙම බැනුම් අහන්න වෙනවට. මම ලස්සන නැතුවට මම මොනවා කරන්න ද ....? මව ගේ කතා විලාසයෙන් වේදනාවට පත් දියණියක ගේ ප්‍රකාශයකි.

ඒ බාල දියණිය ගේ හැසිරීම් රටාව තමාට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීම සඳහා වැඩිමහල් දියණියගේ ක්‍රියාකලාපය උසස් කොට පෙන්වීමට මව උත්සාහ කරන්නට ඇති. නමුත් තම චර්යා රටාවට බාධාවන නිසා දියණිය සිතට ගෙන ඇත්තේ මව තමාට ආදරය නොකරන බවයි. තවත් දියණියක් පැවසුයේ තම මවට හිරිහැර කරන පියාගෙන් දික්කසාද වෙන්නට තිබූ ඉඩ නැති කලේ තමන් බව පවසා මව කේන්ති ගිය විට තමාට ද වද දෙන බවයි. "උඹ ඉපදුනේ නැත්නම් මම දික්කසාද වෙලා අගේට ජීවත් වෙනවා. මගේ කරුමෙට උඹ ඉපදුනානේ. " මෙසේ කියමින් පියාගෙන් ලැබෙන වදහිංසාවල පලිය මව තමාගෙන් ගත්තා යැයි දියණිය පවසයි. ගැහැණු ළමයකු නිසා ඇයට පියකු සිටිය යුතු බව මවගේ අදහසයි. මේ නිසා දියණියගේ අනාගතය වෙනුවෙන් ඇය සියලු දුක් උසුලයි. නමුත් දරුවාට ඉන් සිදු වන යහපතක් නම් නැති බව පෙනෙයි.

කුඩා කළ පටන් ම දඟකාර දරුවාගේ හැසිරීම පාලනය කරගැනීම සඳහා සුදුසු නොවන වචන භාවිත කරන වැඩිහිටියකු විසින් නොදැනුවත්වම කරන්නේ දරුවාට හානියකි. "පුතා නම් හරිම නරක ළමයෙක්... මම කියන දේ අහන්නෙම නෑනේ...බලන්න අයියා වැඩකරන හැටි. ඒ වගෙ ඉන්න ඉගෙනගන්නකො ඔයත්" කුඩා පුතුගේ දඟකාරකම් කෙලවර නොවන නිසා කේන්තියට පත්වන මවක් මෙසේ පැවසීමට ඉඩ තිබේ.

පුතු ගේ දඟකාරකම් මවට කරදරකාරී වන තත්ත්වයට පැමිණ ඇතත් මෙවැනි වදනකින් දරුවාගේ සිත පළුදු වෙයි. තමා තම සොහොයුරා තරම් වටිනා අයකු නොවන බව ඔහුට සිතෙනු ඇත. මව කෙරෙහි ඇති බැඳීමට හානියක් සිදුවනු ඇත. "අයියා හොඳ ළමයා මම නරක ළමයා...." ලෙසින් සිතාගැනීමට පෙළඹෙනු ඇත. තමා පිළිබඳ අනාරක්ෂිත හැඟීමක් සිතට ඇතුළු කරගැනීමට ද වැඩිහිටියකු වැඩිදුර නොසිතා කියන මෙවැනි වදනක් හේතුවිය හැකිය. එසේම තම සොහොයුරා කෙරෙහි ඊර්ෂියාවක් ඇතිවීමටට ද දරුවා පෙළඹෙනු ඇත. "මම චූටි දුවට කොච්චර ආදරේ ද ? ඒත් ඔයා කරන වැඩේට නම් මම කොහෙත්ම කැමති නෑ." වැනි අයුරකින් දරුවාගේ ක්‍රියාවට ඇති අකැමැත්ත ප්‍රකාශ කළ හැකියි. එහිදී ඇගේ ක්‍රියාව මිස ඇය නරක නොවන බව දරුවාට ඒත්තු යයි.



නිවසින් පිටතට යන මවක ගේ ගමනට දරුවා අකැමැත්ත ප්‍රකාශ කරන විට මම මේ සේරම කරන්නේ දුව නිසානේ. කියමින් මව තම ක්‍රියාවට දරුවාගේ කැමැත්ත ගැනීමට බලයි. මෙහිදී ද දියණිය ගේ සිතේ මව කෙරෙහි ඇති විශ්වාසය බිඳ වැටෙනු ඇත. "අම්මා කියන්නේ බොරු අම්මට මාව ඕනෙ නැති නිසා දාලා යනවා" කියා ඇය සිතනු ඇත. මව නිවසින් බැහැරව ගත කරන කාලය තුළ දරුවාට ඇති වන පාළුව මඟ හැර ගත හැකි අයුරින් පරිසරය සකස් කරගැනීමට මවට හැකි විය යුතුය.

දරුවාට කෙලෙස කරුණු අවබෝධ කර දුන්නත් මෙය තදින්ම බලපානු ඇත. ආර්ථික ගැටලු පිළිබඳ දරුවාට නොවැටහෙයි. "තාත්තාට මේ හැම දෙයක්ම කරන්න බැරි නිසානේ දුව අම්මා වැඩට යන්නේ . මම හුඟක් හිතුව ඒත් වෙන කරන්නම දෙයක් නැති නිසානේ යන්නේ' ආදී වශයෙන් දරුවාට වැටහෙන ලෙසින් පවුලේ යහපත සඳහා මව කැපවෙන බව ඒත්තු ගැන්වීම කළ යුතුය.

නමුත් යම් ප්‍රමාණයකට හෝ දරුවාට පාඩුවක් වීම නොවැළැක්විය හැකිය. මෙරට පවතින සංස්කෘතික වටපිටාව ද මීට හේතු වෙයි. අප ගේ පවුලක ප්‍රබලම ශක්තිය අම්මායි.

තවත් සමහර අවස්ථාවලදී දරුවා ගේ ක්‍රියාවන් පාලනය කරගත නොහැකිවන විය තාත්තාට කියන බව පවසමින් දරුවා පාලනය කරගැනීමට මව උත්සාහ දරයි. මෙමඟින් මව අපේක්ෂා කරන පරිදි පියා කෝප වෙයි යන බිය නිසා තම ක්‍රියාව නතර කිරීමට දරුවා පෙළඹෙයි. නමුත් මවට තමාගේ ක්‍රියා පාලනය කළ නොහැකි බවද දරුවාට හැඟී යයි. එසේම තම පියා නරක නපුරු අයෙක්ය යන හැඟීමක් දරුවාට ඇති විය හැකියි. මෙවැනි හැඟීම් ළමා මනසට උචිත නොවේ. තමා පවසන තමා අවවාද දෙන හැම වදනක් ගැනම වැඩිහිටියන් කල්පනාකාරී විය යුත්තේ ඒ නිසාය.

දඬුවම දරුවාගේ වරද නිවැරදි කර ගැනීම සඳහාම සකස් විය යුතුය. එමෙන්ම කළ වරදට, දරුවාගේ වයසට, සෞඛ්‍ය තත්වයට චිත්ත වේගී ස්වභාවයට හා පරිණත භාවයට ගැලපෙන දඬුවමක් වීමද වැදගත් වේ. දඬුවම තුළ වරද නිවැරදි කිරීමේ හැකියාවකින් යුත් අධ්‍යාපනික මුහුණුවරක් පැවතීම ද අවශ්‍ය වෙයි. ❐